රුපියල්
# මිලියන 7,112ක ආයෝජනයෙන් පාසල් සිසුන්ට

සුරක්ෂා
සදා සුරකිමු දැයේ දරුවන්

# සිසු රක්ෂණාවරණය

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

SLIC Sri Lanka Insurance GENERAL

රජයේ සියලු ම පාසල්වල සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලත් පිරිවෙන් මෙන්ම උපකෘත විශේෂිත පාසල්වලත් අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සුරක්ෂා සිසු රක්ෂණාවරණය **2024-07-01** දින සිට වසර තුනක කාලයක් සඳහා ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය එක්ව කටයුතු යොදා ඇත.

## රක්ෂණාවරණයෙන් ඔබේ දරුවාට...

### සෞඛ්‍ය රක්ෂණාවරණ

- නේවාසික ප්‍රතිකාර ප්‍රතිලාභ - රු.300,000/= (රජයේ/ පෞද්ගලික රෝහල්)
- බාහිර ප්‍රතිකාර ප්‍රතිලාභ - රු.20,000/=
- අසාධ්‍ය රෝග ප්‍රතිලාභ - රු.1,500,000/= දක්වා

### අනතුරු රක්ෂණාවරණ

- පූර්ණ සදාකාලික අකර්මණ්‍යතා සඳහා රු.200,000/=
- සදාකාලික අර්ධ අකර්මණ්‍යතා සඳහා රු.150,000/=
- තාවකාලික අකර්මණ්‍යතා සඳහා රු.25,000/= සිට රු.100,000/- දක්වා

### ජීවිත රක්ෂණාවරණය

වාර්ෂික ආදායම රු.180,000/= කට වඩා අඩු ආදායම්ලාභී පවුල් වල සිසුන්ට අමතරව 'අස්වැසුම' වැඩසටහනට අයත් පවුල්වල සිසුන්ගේ මාපිය/ නීත්‍යනුකූල භාරකරු වියෝවකදී සිසු දරුවකු සඳහා රු. 75,000/= බැගින් හිමි වේ. එක් මරණයක් වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම මුදල රු. 225,000/= වන අතර පවුලේ සියලුම සිසුන් අතර එම මුදල සමානව වෙන් කෙරේ. මාපියන් දෙදෙනාගේම හෝ නීත්‍යනුකූල භාරකරුගේ මරණ සඳහා වෙන් වෙන් වශයෙන් මෙම රක්ෂණාවරණය හිමි වේ.

මෙම වැඩසටහන මඟින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා හිමිකම් පත්‍රය ඇතුළු අදාළ අනෙකුත් සියලු ම ලිපි ලේඛන පාසලේ විදුහල්පති විසින් සහතික කර **ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ : https://www.srilankainsurance.lk/suraksha/** වෙබ් අඩවිය වෙත උඩුගත කිරීම (Upload) කළ යුතු වේ.

සුරක්ෂා රක්ෂණය ක්‍රියාත්මක කිරීමට අදාළ ව අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අතර ගිවිසුම්ගත වීම අධ්‍යාපන අමාත්‍යාංශයේ දී අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු විය.

අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ ලේකම් තිලකා ජයසුන්දර මහත්මිය ගිවිසුමට අත්සන් තැබූ අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙනුවෙන් එහි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී ප්‍රියන්ත පෙරේරා මහතා ඊට අත්සන් තැබී ය.









පරිවර්තනීය අධ්‍යාපන ක්‍රියාදාමයෙන් නවෝත්පාදනය බලගැන්වෙන සුහුරු රටක්
இயல்மாற்றும் கல்வி செயன்முறைகளால் புத்தாக்கத்தை வலுவூட்டும் சாமர்த்திய நாடு
A smart country where innovation is empowered by transformative education